# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 11/2016 (i)

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 අගෝස්තු මස 05වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>වෘත්තීය සමිති ක්‍රියාමාර්ග</u>**

ඉහත කරුණ සම්බන්ධව නිකුත් කරන ලද 2016 අගෝස්තු මස 04 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 11/2016 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

පරිවාස කාලයේ පසුවන සේවකයන් 2016 අගෝස්තු මස 05වන දින සේවයට වාර්තා කළ යුතු බව හා එදින සේවයට වාර්තා කිරීමට අපොහොසත් වන්නන් තනතුර අතහැර ගියා සේ සලකා කටයුතු කළ යුතු බව කාරුණිකව සටහන් කර ගන්න.

ඇතැම් වෘත්තීය සමිතිවල සාමාජිකයන් සේවකයන් සේවයට වාර්තා කිරීම වැළැක්වීමට ප්‍රජාතාන්ත්‍රික නොවන විධික්‍රම යොදවා ඇති බවට ද කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී ඇත. එවැනි ප්‍රජාතාන්ත්‍රික නොවන ක්‍රියා වැළැක්වීමට සහ සේවය සඳහා සූදානම් සේවකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය යැයි සැලකෙන සියලු ක්‍රියා මාර්ග ගැනීම කළමනාකාරීත්වය මත පැවරුණු වගකීමකි.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. ප්‍රධාන අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති